


මහින්ද දිසානායක දිවුල්ගනේ

බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය සාදරයෙන් ඉදිරිපත් කරන වෙස්ටර්න් නයිට් සුහද හමුව මෙවර බොහෝ වෙනස්කම් සහිතව ප්‍රදේශවාසී ඔබ සඳහා සංවිධානය කොට ඇත. වසර ගනනාවක්ම නොකඩවා "ආප්ප රාත්‍රිය" නමින් පවත්වාගෙන ආ මේ සුහද හමුව මෙවර නවමු බවකින් අකර්ෂණීය අංග රාශියක් ඇතුලත් කරමින් ඉදිරිපත් කිරීමට සංවිධායක මණ්ඩලය සැලසුම් කොට තිබීම කාලීන වැදගත්කමකි.

මෙම සුහද හමුව වසරක් පාසා නොකඩවා පවත්වාගෙන ඒම විශේෂයක් වන අතර ඒ හා සමඟ බැඳුනු හේතු රාශියක් බද්ධ වී තිබේ. එනම් බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සමිතිය හා එයට සම්බන්ද ප්‍රාදේශීය සුහද ජනතාව එකට එකතු කර ඔවුන් සමඟ සුහඳ බව වර්ධනය කර ගැනීමයි. විශේෂයෙන්ම විහාරස්ථානයට අනුබද්ධිත සිංහල භාෂා පාසැලේ දෙමාපියන් ඇතුලු පිරිසද මේ හා එකතු වී සතුට බෙදහද ගැනීම විශේෂයකි. විශේෂයෙන් සඳහන් කළ යුත්තේ කිසිම වාද භේදයකින් තොරව ප්‍රාදේශීය සියලු පොදු පිරිස මෙම සුහදහමුව හා අත්වැල් බැඳගනී.

විශේෂයෙන් මෙහිදී ප්‍රාදේශීය සංවිධාන අතර හිතවත් බව, පවුල් අතර පුද්ගලයන් අතර ඇති කිරීම මෙහිදී කැපී පෙනෙන වැදගත් අංගයකි. තවත් කිවයුතු කරුණක් වන්නේ අපේ දරුවන් අනෙකුත් දරුවන් හඳුනා ගෙන ඔවුනොවුන් අතර සම්බන්ධතා පවත්වාගෙන යාම සමාජ සුහදබව සංවර්ධනයට හේතු වේ. මෙම කරුණා විශේෂ අරමුණක් සේ සැලකිය හැකිය.

මෙතෙක් කාලයක් පවත්වාගෙන ආ මෙම සුහද හමුව මෙල්බන් වාසී ප්‍රාදේශීය පොදු ජනතාව අපේක්ෂා කළ එකමුතු කළ හමුවකි. මේ හමුව සැබෑ අර්ථයෙන්ම සුහද හමුවකි. මෙවර අප සංවිධායක මණ්ඩලය මෙවර කාටත් ලෙහෙසි පහසු නවීව වු ක්‍රමයට සංවිධානය කොට තිබීම විශේෂ වෙනසකි. එමෙන්ම මෙම හමුව සඳහා කලාඅංග කීපයක්ද රසවින්දය වෙනුවෙන් මෙවර ඉදිරිපත් කෙරෙයි. මෙවර සුහද හමුවේ විශේෂ වෙනස් කමක් ලෙස සඳහන් කළ හැකිය.

මෙවර අපේ සුහද හමුව සඳහා සංගීතයෙන් දයක වන්නේ මෙල්බන් ජනතාව හොඳින් දන්නා ජනප්‍රියතම වාදක මණ්ඩලයක් වන රොෂාන් ප්‍රමුඛ බී ෂාප් (BE SHARP) වාදක වෘන්දයයි. පැමිණෙන ඔබ හැමගේම සිත් ප්‍රබෝධමත් වන සුහද සංගීතවත් රාත්‍රියක් වනවාට කිසිම සැකයක් නැත. ඔබට ඇතිවන තුරු නටන්නට විනෝද වන්නට මේ සොඳුරු දවසේ හැකිවේවි. වෙනද මෙන් රැෆල් ටිකට්පත් දිණුම් ඇදීමද සුපුරුදු පරිදි වටිනා දිණුම්පත් රාශියක් සමඟ සිදුවේ. තවත් ඔබට මතක්කල යුතු දෙයක් වන්නේ ඔබ වෙනුවෙන් ආහාර සපයන Hennessy යනු ජනප්‍රියතම ප්‍රනීත ආහාර සපයන යමක් පිළිවෙලට සංවිධානය කරන සුහදසීලි ආයතනයක් වීමයි. එම නිසා මෙවරද සහභාගි වන ඔබට ප්‍රනීත ආහාර වේලක රස විදීමට ඉඩ පහසුකම් අප සංවිධායක මණ්ඩලය සලසා තිබේ.

වාර්ෂික සුහද හමුව පැවැත්වීමේ ප්‍රමුඛ පරමාර්ථයක් වශයෙන් සඳහන් කළ යුත්තේ මේ හමුවෙන් ලැබෙන සියලුම මුදල් අප රොක්බෑන්ක් පාරමිතා බෞද්ධ විහාරයේ විහාරස්ථ ගොඩනැගිලි අරමුදල සඳහා සෑම සතයක්ම යෙදවීමයි. සහභාගී වන ඔබ සැමට විනෝදයක් රස විදීම මෙන්ම මාහැඟි පුණ්‍ය කටයුත්තක් සඳහාද දායක විය හැකිය. වාර්ෂිකව පවත්වන මේ සුහද හමුව සඳහා විහාරස්ථානයට සම්බන්ධ හා ප්‍රාදේශීය විශාල පිරිසක් සහභාගී වීම නොකඩවාම සිදුවේ. මෙවරද විශාල ජනතාවකගේ සහභාගිත්වය අප සංවිධායක මණ්ඩලය අපේක්ෂා කරයි. මෙවරද ඉඩකඩ ඇති හොත් ෂන්සයින්හි ඇති බර්නඩේට් කමිනිටි ශාලාවේදී (ST BERNADETTE) මෙම වෙස්ටර්න් නයිට් සුහද හමුව පැවැත්වේ.
(I COOKE AVE - NORTH SUNSHINE - MEL REF 26. G 8)

ප්‍රදේශවාසී ඔබ සැමට සංවිධායක මණ්ඩලය සුහද සිතින් ආරාධනා කරයි

ප්‍රවේශ පත්‍ර : විමසීම්

| | |
|---|---|
| ජයතිස්ස | 041 6270560 |
| ධනවංශ | 046 9403981 |
| රෝහන | 041 6154313 |

**මේ හමුවෙන් ලැබෙන සියලුම මුදල් රොක්බෑන්ක් පාරමිතා බෞද්ධ විහාරයේ විහාරස්ථ ගොඩනැගිලි අරමුදල සඳහා ය**





